File No : ......................................

**ගිවිසුම** **සේවා**

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් සංස්ථාපනය කරන ලද ස්වකීයප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත අංක 234 හිපිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (මෙහි මින් මතු **කාර්යාංශය** යැයි සඳහන් කරනු ලබන අතර එකී කාර්යාංශයේ අනුප්‍රාප්තිකයන් හා අද්මිනිස්ත්‍රාස්කරුවන් ද ඇතුළත්ව) **පළමු වන පාර්ශවයට** ද,

**සහ**

මෙහි මින් මතු **සේවා නියුක්තිකයා** යැයි කියනු ලබන..................................................................................[1]

ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ....................................................[2] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ

.................................................................................................................................................

................................................................[3] හි පදිංචි (ජා.හැ.අ ......................................[4]) හිමි

................................................................................................................................................[5]

(එකී සේවා නියුක්තිකගේ උරුමකරුවන්, පොල්ම:කරුවන් හා අද්මිනිස්ත්‍රාස්කරුවන් අදහස් කෙරෙන හා ඇතුළත්ව) යන අය **දෙවන පාර්ශවයට** ද බැදී ....................................[6]දින බත්තරමුල්ලේ දී පහත පොරොන්දු ගිවිසිලිවලට එකගව ඇති කරගත් ගිවිසුමේ වගනම්,

01. දකුණු කොරියානු රාජ්‍යයේ ...................................................................................................[7] ආයතනයේ.................................... [8]දිනැති ගිවිසුම (කොරියානු රැකියා ගිවිසුම) ප්‍රකාරව කම්කරුසේවකයකු වශයෙන් සේවය කිරීමට (මින් මතු "විදේශ රැකියාව" ලෙස හැදින්වෙන) දෙවන පාර්ශවය එකගව ඇත.

02. මෙම විදේශ රැකියාඅවස්ථාව ශ්‍රී ලංකාවට ප්‍රදානය කර ඇත්තේ දකුණු කොරියානු රජය යටතේ සංස්ථාපිත කම්කරු අමාත්‍යාංශය සමඟ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ රැකියා විෂය භාර අමාත්‍යාංශය 2017 වසරේ නොවැම්බර් මස 29 දින ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව බවත් එම ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව මෙහි සඳහන් විදේශ රැකියා අවස්ථාව සේවා නියුක්තිකයා වෙත ලැබුණු බවටත් මෙම විදේශ රැකියාව සඳහා පිටව යාමට මෙම ගිවිසුමට ඇතුළත් වන්නේ විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින සංස්ථාපිත ආයතනයක් වූ සහ මෙහි පළමු පාර්ශවය වූ ශ්‍රීලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ බවත්කොරියානු රැකියා ගිවිසුම කිසියම් අවස්ථාවකදී සේවා නියුක්තිකයා විසින් උල්ලංඝනය කල හොත්, එකී කොරියානු රැකියා ගිවිසුමට අනුව එකඟ වූ රැකියා ස්ථානය අතහැර ගියහොත් ශ්‍රී ලංකාවේ කිර්තිනාමයට බලවත් හානියක් හෝ අගතියක් සිදුවන බවත් පළමු පාර්ශවයේ මහජන සේවා කටයුතු සඳහා බලවත් අගතියක් සිදු වන බවත් ශ්‍රී ලංකාවේ රැකියා අපේක්ෂකයින්ට අනාගතයේ දි විදේශ රැකියාවන් ලබාගැනිමේ දි අහිතකර තත්වයක් උද්ගත විය හැකි බවත් එකී විදේශ රැකියාවේ වටිනාකම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ***රුපියල් ලක්ෂ විස්සක් (රු 2,000,000/-)*** බවත් දෙපාර්ශවය පිළිගනී.

03. විදේශ රැකියාවේ කාලසීමාව එම රැකියාව භාරගත් දින සිට මාස ....................... [9]කාලයක් විය යුතුයි. එසේ වුවද ස්වකීය පරම අභිමතය පරිදි එකී රැකියාවේ කාලසීමාව දීර්ඝ කිරීමට හෝ අඩුකිරීමට සහ/හෝ අවසන් කිරීමට ඇති අයිතිය විදේශ රැකියාව ප්‍රදානය කරන ආයතනය විසින් එය වෙතම තබා ගනු ලැබේ. දීර්ඝ කිරීමක් කරනු ලබන අවස්ථාවක හෝ රැකියා ස්ථාන මෙම ගිවිසුමට අනුව මාරු කරන අවස්ථාවක මෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි වූ නියමයන් හා කොන්දේසි ඊට අදාළ විය යුතු අතර මෙම

ගිවිසුම සහ ඇප බැඳුම්කරය ද විදේශ රැකියාව දීර්ඝ කරන ලද කාලයට සහ රැකියා ස්ථාන මෙම ගිවිසුමට අනුව මාරු කරන අවස්ථාවක දී වුවද වලංගු විය යුතුය.

04. කිසිදු අවස්ථාගත කරුණක් යටතේ වුවද සේවා නියුක්තිකයාට පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව සේවා යෝජකයාගේ ලිඛිත අවසරයකින් තොරවසහ පළමු පාර්ශවයේ අවසරයකින් තොරව වෙනත් යම් රැකියාවක නිරතවීමට හිමිකම් හෝ අවසර නොමැති අතර සේවා යෝජකයාගේ සහ පළමු පාර්ශවයේ අවසරයකින් තොරව සිය වැඩ කරන ස්ථානයෙන් (සේවා ස්ථානය මාරු කිරීමක දී වුවද) ඉවත් නොවිය යුතුය.

05. රැකියාවේ කාලසීමාව සම්පූර්ණ කිරීමට පෙරාතුව සේවා නියුක්තික සිය කැමැත්තෙන් කොරියානු රැකියාව ප්‍රදානය කරන ආයතනයෙන් ඉවත්ව ගිය අවස්ථාවක සේවා නියුක්තිකයා විසින් එම අවස්ථාව වන විට එම රැකියා ආයතනයට අයවිය යුතුව තිබූ යම් මුදලක් වේ නම් එකී සමාගම හෝ සමාගම් විසින් තීරණය කරනු ලැබිය හැකි එවැනි මුදලක් සේවා නියුක්තිකයා විසින් ප්‍රදානය කරන ආයතනයට ගෙවිය යුතුය.

06. ඉහත අංක 04 හා 05 අනුවසේවා ස්ථානය මාරු කිරීමේ දී <u>දකුණු කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනය</u> (HRD Korea) විසින් පනවා ඇති නීති රීතීන්ට අනුකූල විය යුතු අතරම සේවා නියුක්තිකගේ නව රැකියාව වහාම <u>දකුණු කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයේ</u> ලියාපදිංචි කල යුතුය.

07. එකී විදේශරැකියාවට අදාළ දීමනා /ගෙවීම් හෝ පාරිශ්‍රමික, ප්‍රදානය කරන ආයතනය හෝ සාමාජික සමාගම හෝ කළමනාකරණ සමාගම සේවා නියුක්තික විසින් අත්සන් කරන ලද සේවාගිවිසුමේ නියමයන් හා කොන්දේසි අනුව සේවා නියුක්තිකයා වෙත ගෙවනු ලැබේ.

08. සේවා නියුක්තික දකුණු කොරියානු රාජ්‍යයේ සේවයේ යෙදී සිටින කාලය තුළදී එම ආයතනයේ ඉහල නිලධාරීන් විසින් ඔහුට දෙනු ලබන උපදෙස් අනුව කටයුතු කල යුතු අතර, ඔහුගේ රැකියාවේ කාර්යය නිසි ලෙස ඉටු කල යුතුය. තවද ප්‍රදානය කරන ආයතනය සෑහීමකට පත්වන පරිදි ස්වකීය රාජකාරිය ඔහු විසින් නිසි ලෙස කරගෙන යාම, ඉටු කිරීම කල යුතුය.

09. මෙහි පහත සඳහන් කරනු ලබන යම් හේතුවක් හෝ කිහිපයක්මතයම් අවස්ථාවක මෙම ගිවිසුම අවලංගු කිරීමේ සහ සේවා නියුක්තිකයා ආපසු කැඳවීමේ බලය සහ නිදහස පළමු පාර්ශවයටතිබේ.

(අ) සේවා නියුක්තිකයාගේ වැඩ සහ / හෝ හැසිරීම විදේශ රැකියාව ප්‍රදානය කරන ආයතනය විසින් හෝ සාමාජික සමාගම විසින් හෝ කළමනාකරණ සමාගම විසින් අසතුටුදායක බව තීරණය කරනු ලැබුවහොත්,

(ආ) අසනීප තත්වය නිසා හෝ සේවා නියුක්තිකයාගේ සෞඛ්‍ය තත්වය රැකියාව අඛණ්ඩව කරගෙන යාම සඳහා අයෝග්‍ය හෝ නුසුදුසු බව තීරණය කල හොත්,

(ඇ) සේවා නියුක්තිකයා විසින් මෙහි දක්වා ඇති නියමයන් හෝ කොන්දේසි අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවහොත්,

(ඈ) සේවා නියුක්තිකයා රාජ්‍ය විරෝධී (ශ්‍රී ලංකා රජය හා දකුණු කොරියානු රජය යන දෙකම) ක්‍රියාවලට මැදිහත් වීම නිසා හෝ එවැනි ක්‍රියාවලට සහභාගී වී සිටින බවට සැක කිරීම නැතහොත් එකී ශ්‍රී ලංකා සහ දකුණු කොරියානු රාජ්‍යයන් සම්බන්ධයෙන් හෝ එම රටවල සිරිත් විරිත් හෝ සංස්කෘතිය සම්බන්ධයෙන් අගතිගාමී ප්‍රකාශ කළ හොත්,

10. නියමිත රැකියාවේ කාල සීමාව සම්පූර්ණ කිරිමෙන් පසු හෝ මේ ගිවිසුමේ නියමයන් අනුව රැකියාව අවසන් කල පසු සේවා නියුක්තිකයා වහාම ශ්‍රී ලංකාවට පැමිණිය යුතු අතර එසේ පැමිණ සති දෙකක් ඇතුළත දී පළමු පාර්ශවයට දැනුම් දිය යුතුය.

11. තවද ඉහත 06ට අනුව දකුණු කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයෙහි(HRD Korea) ලියාපදිංචි කර නීත්‍යානුකූලව නව රැකියාවක නිරත වුවහොත් එම රැකියා ස්ථානයට අදාල සේවා ගිවිසුමඋල්ලංඝනය කරමින් ඉන් ඉවත් වුවහොත් හෝ නියමිත සේවා කාලය අවසන් වුවහොත් සේවා නියුක්තිකයා වහාම ශ්‍රී ලංකාවට පැමිණිය යුතු අතර එසේ පැමිණ සති දෙකක් ඇතුළත දී පළමු පාර්ශ්වයට දැනුම් දිය යුතුය.

12. සේවා නියුක්තික විසින් මේ ගිවිසුම උල්ලංඝනය කළ අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ***රුපියල් ලක්ෂ විස්සක (රු 2,000,000/-)*** මුදලක් ඉල්ලා සිටි දිනට එකවර නොපමාව ගෙවීම පිණිස දෙවන පාර්ශවය බන්ධනය වී සිටින බවට දෙවන පාර්ශවය මෙයින් එකඟ වේ.

13. සේවා නියුක්තික (දෙවන පාර්ශවය) විසින් ඉහත කී විදේශ රැකියා ගිවිසුම /ගිවිසුම් කඩ වන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා කර ඇත්නම් ඉහත සඳහන් ***රුපියල් ලක්ෂ විස්සක (රු 2,000,000/-)*** මුදල පළමු පාර්ශ්වයට අය කර ගැනිමට සම්පූර්ණ නෛතික හිමිකමක් හා බලයක් ඇති බැව් දෙවන පාර්ශවයපිලිගනී.

14. විදේශ රැකියාව ප්‍රදානය කරනු ලබන දකුණු කොරියානු ආයතනය සමග ඇති කරගත් කොරියානු රැකියා ගිවිසුමට අනුව සේවය අවසන් කිරීමට පූර්ණ නිදහස සේවා නියුක්තිකයාට පවතියි. මෙම ගිවිසුම හා ඇපබැදුම්කරය අදාල විදේශරැකියාව අනිවාර්යයයෙන් කළ යුතුය යනුවෙන් බැදීමක් ඇති කිරීමට හෝ සේවා නියුක්තිකයාගේ කැමැත්ත පරිදි රැකියාවක් කිරීමට ඇති නිදහසට මෙම ගිවිසුම කිසිදු බාධාවක් ඇති නොකරයි. නමුත් මෙම විදේශ රැකියාව හේතුවෙන් කොරියානු රාජ්‍යයේ රැකියා කිරීම සඳහා අවසර ලැබී ඇති බැවින් අදාල රැකියාව නොකොට කොරියානු රාජ්‍යයේ නීති විරෝධී ලෙස සේවා නියුක්තිකයා රැදී සිටීම වැලැක්වීම සඳහාත් මෙම ගිවිසුමේ විදේශ රැකියාව සඳහා කොරියානු රාජ්‍යයේ වීසා බලපත්‍රය ලැබී ඇති බැවින් කිසියම් හෝ හේතුවක් මත විදේශ රැකියාව අවසන් වුවහොත් අදාල වීසා බලපත්‍රය අවසන් නොවුවද වහාම සේවා නියුක්තිකයා ශ්‍රී ලංකාවට පැමිණිය යුතුය.

15. මෙම ගිවිසුම යථා පරිදි බලාත්මක කරගැනීම සඳහා පළමු පක්ෂය පිළිගත් ඇප කරුවන් දෙදෙනෙකු සේවා නියුක්තිකයා වෙනුවෙන් සේවා නියුක්තිකයා විසින් ඉදිරිපත් කළ යුතුය. සේවා නියුක්තිකයා විසින් ඒකපාක්ෂිකව මෙම ගිවිසුම උල්ලංඝණය නොකරන බවට තහවුරු කිරීම පිණිසත් එලෙස මෙම ගිවිසුම උල්ලංඝනය කළහොත් සේවා නියුක්තිකයා විසින් පළමු පක්ෂයට ගෙවීමට බැදී සිටින ***රුපියල් ලක්ෂ විස්සක (රු 2,000,000/-)*** මුදල එකී ඇපකරුවන් හෝ සේවා නියුක්තිකයා එක්ව හෝ වෙන් වෙන්ව පළමු පක්ෂය විසින් ඉල්ලා සිටි අවස්ථාවකදී ගෙවිය යුතු වේ.ඒ අනුව පහත සඳහන් ඇපකරුවන් සේවා නියුක්තිකයා විසින් ඉදිරිපත් කරනු ලබයි.

<u>පළමු ඇපකරු ලෙස</u>

........................................................[10] ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ....................................................[11] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ................................................................................................................................................................[12] ලිපිනයෙහි පදිංචි (ජා.හැ.අං.........................................................[13]) හිමි ....................................................................................................................................................................[14]ද,

<u>දෙවන ඇපකරු ලෙස</u>

..................................................[15] ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ....................................................[16] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ..........................................................................................................................................................[17] ලිපිනයෙහි පදිංචි (ජා.හැ.අං.........................................................[18]) හිමි ....................................................................................................................................................................[19]ද,

16. මෙම ගිවිසුම සම්බන්ධයෙන් පැන නඟින සියලු ආකාරයේ කටයුතු සහ ආරවුල් සම්බන්ධයෙන් අධිකරණ බලය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටි දිසා අධිකරණ බල සීමාව විය යුතු බව පාර්ශවකරුවන් වැඩි දුරටත් පිළිගෙන එකඟ වනු ලබන බවටත් මෙම ගිවිසුම මඟින් තව දුරටත් මෙලෙස සාක්ෂි දරණු ලැබේ.මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා සියළුම දැනුම් දීම් සේවා නියුක්තිකයාගේ හා

ඇපකරුවන්ගේ ඉහත දක්වා ඇති ලිපිනයන්ට ලිපි, සිතාසි හා නොතිසි භාර දීම වලංගු හා නිසි භාරදීමක් ලෙස පාර්ශවයන් එකඟ වී පිළිගනු ලබයි.

17. ඉහත පළමු වගන්තියේ පරිදි කොරියානු රැකියා ගිවිසුමේ සඳහන් රැකියා ස්තානයේම සේවය කිරිමට සේවා නියුක්තික බැඳී සිටින අතර විදේශ රැකියා ස්ථානය කිසියම් කරුණක් මත මාරු කරන්නේ නම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හෝ දකුණු කොරියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් සේවා නියුක්තික විසින් අනුමැතිය ලබා ගත යුතුය. එසේ අනුමැතියකින් තොරව සේවා ස්ථානය මාරු කලහොත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සම්බන්ධීකරණයෙන් පවත්වනු ලබන කොරියානු භාෂා පරීක්ෂණය සඳහා අයදුම් කිරිමට සේවා නියුක්තිකට නොහැකි වේ.

18. මෙම ගිවිසුමේ වලංගු කාලය අංක 01හි සඳහන් කොරියානු රැකියා ගිවිසුම ප්‍රකාරව විදේශ රැකියාව සඳහා දකුණු කොරියාවට ගොඩ බසින මොහොතේ සිට එකී කොරියානු රැකියා ගිවිසුම සහ ඉහත 06 අනුව දකුණු කොරියානු මානව සම්පත් සංවර්ධන සේවා ආයතනයේ ලියාපදිංචි කලනව රැකියා ගිවිසුම / ගිවිසුම් ප්‍රකාරව නියමිත සේවා කාලය හා දීර්ඝ කරන ලද සේවා කාලය විය යුතුය. කොරියානු රැකියා ගිවිසුම / ගිවිසුම් පරිදි සේවා නියුක්තික කටයුතු කල යුතුය.

ඉහත පළමු පාර්ශවය සහ දෙවන පාර්ශවය ඉහත සියලු ප්‍රකාශයන්ට එකඟව වගකීම් මැනවින් අවබෝධ කරගත් බැවින් ඉහත සියලු ප්‍රකාශයන්ට නියමිත වගකීම් භාරගැනීම සඳහා බත්තරමුල්ලේ දී පහත අත්සන් තබන ලදී.

**<u>පළමු පාර්ශවය</u>**

.........................................................

තනතුර:-නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(පුහුණු) / කළමනාකරු බඳවාගැනීම් (කොරියානු) - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**<u>දෙවන පාර්ශවය</u>**

....................................

**සේවා නියුක්තික (අත්සන)**

**<u>සාක්ෂි</u>**

1. ……………………………………….………………......................……...……… 
(නම, ජාතික හැඳුනුම්පත් අංකය) (අත්සන)

2. ……………………………………….…………………...….........……............... 
(නම, ජාතික හැඳුනුම්පත් අංකය) (අත්සන)

මෙම ඇප බැදුම්කරයේ අඩංගු කරුණු මා විසින් මෙහි සඳහන් සියලු පාර්ශවයන්ට කියවා පැහැදිලි කර දුන් පසු එම කරුණු තේරුම්ගෙන මා ඉදිරියේ දී මෙම ලියවිල්ලට හා මෙම ලියවිල්ලට සමාන තවත් පිටපතකටත් ඔවුනොවුන් විසින් ................................ දින දී බත්තරමුල්ලේදී අත්සන් තබන ලද බවට මෙයින් සහතික කරමි.

**නීතිඥ**